අමාත්‍යාංශ චක්‍රලේඛ අංක :- 95/07

මගේ අංකය :- 4/ගුරුආ/1/3099
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
1995 මාර්තු මස 8 දා.

පළාත් අධ්‍යාපන ලේකම් මගින්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
කොට්ඨාස භාර නි. අ. අ. වරුන් වෙත.

## ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීම
## ගුරු භවතුන් අන්තර්ග්‍රහණය සහ නව වැටුප් ගෙවීම

ශ්‍රී ලංකා ගුරු සේවය 1994. 10. 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපනය කොට ඇත. ගුරු සේවා ව්‍යවස්ථාව මගින යෝජිත නව වැටුප් පරිමාණයන් 1995. 01. 06 දින සිට ක්‍රියාත්මක වේ.

02 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව ගුරු සේවය ක්‍රියත්මක වූ දිනය එනම්, 1994. 10. 06 දින වන විට සේවයේ යෙදී සිටි සියළුම ගුරු භවතුන් ව්‍යවස්ථා සංග්‍රහයෙහි 03 වන කොටසින් විධිවිධාන සැලසී ඇති ආකාරයට ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ යුතු ය. ඔබේ පහසුව සඳහා එහි උධෘතයක් මේ සමඟ එවමි.

03 ගුරුවරයකු ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ යුත්තේ 1994.10.06 දිනට ගුරුවරයා දරු තත්ත්වය අනුවය. එහෙත් 1995.01.01 දිනට එම ගුරුවරයා අන්තර්ග්‍රහණය කරන ලද ශ්‍රේණියට වඩා ඉහළ ශ්‍රේණියකට උසස් කිරීමට සුදුසුකම් ලබතොත් ඒ සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 1 වන කොටසේ 8 වන ඡේදය අනුව කටයුතු කළ යුතු ය.

උදාහරණ වශයෙන් 1985. 01. 01 දින පුහුණු ගුරුවරයෙකු වශයෙන් පත්වීමක් ලත් අයකු 1994. 10. 06 දින වන විට සම්පූර්ණ කර ඇති සේවා කාලය වර්ෂ 09 මාස 09 දින 06 ක් පමණ වන හෙයින් ඔහු අන්තර්ග්‍රහණය කළ යුත්තේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියටය. ඔහු 1995. 01. 01 දිනට පුහුණු ගුරුවරයකු ලෙස වර්ෂ දහයක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ පසු 2 වන පන්තියේ 11 වන ශ්‍රේණියට උසස් කරනු ලැබීම පිණිස ව්‍යවස්ථාවේ 8. 1. 2 අනුඡේදය අනුව තරඟ විභාගයට පෙනී සිටිය යුතුය.

04 වැටුප් ගෙවීම සිදු කළ හැක්කේ අන්තර්ග්‍රහණය පිළිබඳ කටයුතු කිරීමෙන් පසුව බැවින් අන්තර්ග්‍රහණය පිළිබඳ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා ස්වේච්ඡා පදනමක් මත සහාය දක්වීමට ගුරු සංගම් කැමැත්ත පළ කොට ඇත. කෙසේ වෙතත්, එසේ සහාය කර ගනු ලබන ගුරු සංගම් නියෝජිතයන්ගේ ලේඛනයක් ඔවුන්ගේ ආදර්ශ අත්සන් ඇතිව ඔබ වෙත පවත්වා ගෙන යා යුතු අතර එහි පිටපතක් දැන ගැනීම පිණිස මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

05 1994. 10. 06 හා 1994. 12. 31 දින අතරතුර කාලය තුළ විශ්‍රාම ලැබූ ගුරු භවතුන් ද මෙම වැටුප් පරිමාණයට හිමිකම් ලබන බැවින් ඔවුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව නව වැටුප් පරිමාණයන් අනුව ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සකස් කළ යුතු ය. කෙසේ වෙතත්, මෙය දැනට සේවයේ යෙදී සිටින ගුරු භවතුන්ගේ වැටුප් පරිවර්තන කටයුතු වලින් පසුව සිදු කිරීම ගැන විරුද්ධත්වයක් නැත.

06 ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සෑම ගුරු භවතකුම අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියේ සඳහන් දින සිට වසර දෙකක කාලය ඇතුලත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි ඡේදය අනුව විශ්‍රාම යාමේ විකල්පය සඳහා හිමිකම් ලබයි. ඒ බව ගුරු භවතුන්ට දැන්විය යුතු ය.

07 වැටුප් පරිවර්තනය පහසු කරනු පිණිස අදාළ වගුව මේ සමග අමුණා ඇත.

08 ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 03 වන කොටසෙහි විධිවිධාන අනුව මුලින්ම සිදු කළ යුත්තේ පළමු වටයේ අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු පමණි. '02 වන වටයේ' අන්තර්ග්‍රහණ කටයුතු කළ යුත්තේ ඒ පිළිබඳව මා විසින් දෙනු ලබන උපදෙස් ලැබීමෙන් අනතුරුව පමණි.

09 විදුහල්පති ශ්‍රේණිධාරීන් සඳහා ගුරු සේවයට සමාන්තර නව විදුහල්පති සේවයක් ගුරු සේවය ක්‍රියාත්මක වන දින සිට ම ක්‍රියාත්මක වන සේ සකස් කෙරෙන හෙයින් විදුහල්පති ශ්‍රේණිධාරීන් නව ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොකළ යුතු ය.

10 ගුරු අභ්‍යාසලාභීන් පුහුණු කාලය අවසන් කොට ස්ථිර පත්වීම් ලබන තෙක් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොකළ යුතු ය.

11 ව්‍යවස්ථා සංග්‍රහයේ '03 වන කොටසෙහි' සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු පිණිස සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු යයි සඳහන් වන අවස්ථාවල අදාළ සේවා කාලය සතුටුදායක වශයෙන් තීරණය කළ යුත්තේ එම කාලයට අදාළ වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන ඇත්නම් පමණි. දැනට විවිධ ගුරු වර්ගයනට අයත් ගුරු භවතුන් ගුරු සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් නුපුහුණු ගුරුවරු, නුපුහුණු ඩිප්ලෝමාධාරීන්, ගුරු පුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන්, පුහුණු ගුරුවරු, වෘත්තිය සුදුසුකම් නොලත් උපාධිධාරී ගුරුවරුන්, වෘත්තීය සුදුසුකම් ලත් උපාධිධාරී ගුරුවරුන් යන වර්ගයනට ඇතුලත් වන ආකාරය දක්නෙ ඇමුණුමක් ද මේ සමග ඇත.

12 ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කොට නියමිත වැටුප් ක්‍රමවල පිහිටුවීමෙන් පසු නව වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය වන අමතර ප්‍රතිපාදන දැනට පළාත්වලට වෙන් කර දී හැක. කෙසේ වෙතත් වර්ෂයේ මුල් මාස කීපය තුළ වැටුප් ගෙවීම සඳහා දැනට ලැබී ඇති ප්‍රතිපාදන සෑහෙන හෙයින් එම ප්‍රතිපාදන උපයෝගී කොට ගෙන ඔබ පළාතේ ගුරුවරුනට 95. 01. 01 දින නව වැටුප් ගෙවීමට කරුණාකර කටයුතු කරන්න.

වැටුප් පර්වර්තන කටයුතු අවසන් කළ වහාම ඔබ පළාතේ ගුරු වැටුප් සඳහා 1995 වර්ෂයට අවශ්‍ය මුළු මුදල් ප්‍රමාණය ගණනය කර පහත දක්වෙන තොරතුරු මා වෙත දන්වා එවන්න.

(I) 1995 වර්ෂය සඳහා ගුරු වැටුප් ගෙවීමට අවශ්‍ය මුළු මුදල් ප්‍රමාණය
(II) ලැබී ඇති මුදල් ප්‍රමාණය
(III) අමතර අවශ්‍ය ප්‍රමාණය


ඔබ පළාතට අවශ්‍ය අමතර මුදල් ප්‍රමාණය අමාත්‍යාංශය විසින් සපයනු ඇත.

13 මෙහි කිසියම් අපහැදිලි ස්ථානයක් වුවහොත් හෝ තවදුරටත් පැහැදිලි කරගත යුතු කරුණු යමක් ඇත්නම් ඒ පිළිබඳව පහත සඳහන් අයගෙන් විමසිය හැක.

1 සේනානායක උපසේන මහතා
අතිරේක ලේකම් (පාලන),
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
දුරකථන අංකය : 864814

2 එස්. මල්ලවආරච්චි මහතා
නි. අ. අ.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
දුරකථනය : 865874

14 සෑම කාර්යාලයක් විසින් ම සියලුම ගුරු භවතුන් අන්තර්ග්‍රහණය කිරීම සහ නව වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවීමේ කටයුතු හැකි තරම් කෙටි කාලයක් තුළදී අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.



සේනානායක උපසේන
අතිරේක ලේකම් (පාලන)

අත්. කළේ/ එම්. ඩී. ඩී. පීරිස්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්.

පිටපත්

**සියළුම විදුහල්පතීන් වෙත - කරුණාකර මෙම චක්‍රලේඛය ගුරු මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට පෙන්වා විදුහල් කාර්යාලයේ ගොනු කොට තබන්න.**

## III වන කොටස

## ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ සිටින ගුරු සංඛ්‍යාව අන්තර්ග්‍රහණය කිරීම.

01 ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින වන විට අමාත්‍යාංශය යටතේ ඇති රජයේ පාසල්වල සේවය කළ ගුරුවරුන් පහත දක්වෙන අයුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

*ප්‍රථම වරයේ අන්තර්ග්‍රහණය*

1. 1 ගුරුවරයකු වශයෙන් වර්ෂ 10 කට අඩු සේවා කාලයක් ඇති නුපුහුණු ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ 11 වන ශ්‍රේණියට ද,

*පුහුණු ගුරුවරු*

1. 2 ගුරුවරයකු වශයෙන් වර්ෂ 10 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇත්තා වූ නුපුහුණු ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියට ද,

1. 3 ගුරු පුහුණුව රහිත ඩිප්ලෝමාධාරීන් සේවයේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියට ද,

*නුපුහුණු ඩිප්ලෝමාධාරීන්*

1. 4 ගුරුවරයකු වශයෙන් අවුරුදු 10 කට අඩු සේවා කාලයක් ඇති ගුරු පුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන් සේවයේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියට ද,

*ගුරුපුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන්*

1. 5 ගුරුවරයකු වශයෙන් අවුරුදු 10 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇත්තා වූ ගුරු පුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන් සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට ද,

1. 6. පුහුණු ගුරුවරයකු වශයෙන් අවුරුදු 10 කට අඩු සේවා කාලයක් ඇති පුහුණු ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියට ද,

*පුහුණු ගුරුවරු*

1. 7 පුහුණු ගුරුවරයකු වශයෙන් අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ පුහුණු ගුරුවරුන් සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියටද,

1. 8 පුහුණු ගුරුවරයකු වශයෙන් අවුරුදු 20 ක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇත්තා වූ පුහුණු ගුරුවරුන් සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියට ද,

1. 9 උපාධි ගුරුවරයකු වශයෙන් අවුරුදු 10 කට අඩු සේවා කාලයක් ඇති වෘත්තිය සුදුසුකම් නොලැබූ ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියට ද,

*උපාධි ගුරුවරු*

1. 10 උපාධි ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 10 කට අඩු සේවා කාලයක් ඇති වෘත්තීය සුදුසුදම් නොලැබූ උපාධි ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ 1 වන ශ්‍රේණියට ද,

1. 11 උපාධි ගුරුවරයකු වශයෙන් අවුරුදු 20 ක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇත්තා වූ වෘත්තීය සුදුසුකම් නොලැබූ උපාධිධාරීන් සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියට ද,

1. 12 පුහුණු හෝ උපාධි ගුරුවරයකු වශයෙන් අවුරුදු 07 කට අඩු සේවා කාලයක් ඇති වෘත්තීය සුදුසුකම් සහිත උපාධි ගුරුවරුන් සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියට ද,

1. 13 පුහුණු හෝ උපාධි ගුරුවරයකු වශයෙන් අවුරුදු 07 ක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇත්තා වූ වෘත්තීය සුදුසුකම් සහිත උපාධි ගුරුවරුන් සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියට ද,

1. 14 පුහුණු හෝ උපාධි ගුරුවරයකු වශයෙන් අවුරුදු 17 ක සතුටුදායක සේවාවක්

සම්පූර්ණ කර ඇත්තා වූ වෘත්තීය සුදුසුකම් ලත් උපාධිධාරීන් සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියට ද, අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**දෙවන වටයේ අන්තර්ග්‍රහණය**

(ii) ප්‍රථම වටයේ අන්තර්ග්‍රහණයෙන් පසු, අන්තර්ග්‍රහණය ක්‍රියාවලියේම කොටසක් වශයෙන්, I වන පන්තියට උසස් කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබන පහත සඳහන් ගණවලට අයත් නිලධාරීන් අතුරින් I වන පන්තියට උසස් කිරීම සඳහා තරඟ විභාගයක් පැවැත්විය යුතු ය.

(අ) පුහුණු හෝ උපාධිධාරී ගුරුවරයකු වශයෙන් අවුරුදු 22 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇත්තා වූ වෘත්තීය සුදුසුකම් ලත් උපාධි ගුරුවරු

(ආ) පුහුණු ගුරුවරයකු වශයෙන් අවුරුදු 25 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇත්තා වූ පුහුණු ගුරුවරු

[illegible]. 1 මණ්ඩලයේ උපදෙස් පරිදි විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන මෙම පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව හා නූතන අධ්‍යාපන ව්‍යවහාර | ලකුණු 100 යි. |
| (ආ) | සාමාන්‍ය දැනීම | ලකුණු 100 යි. |

## පළමුවන උපලේඛනය

ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගනු ලැබීම සඳහා වන තරඟ විභාගයක ප්‍රතිඵල මත පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ පුද්ගලයන් තෝරා ගනු ලැබේ.

### අධ්‍යාපන සුදුසුකම්

**විශ්ව විද්‍යාලයකට ඇතුලත්වීම සඳහා සුදුසුකම් සහිතව අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත් වී සිටීම.**

### වයස් සීමාව

අවම වයස අවුරුදු 18 යි.

උපරිම වයස අවුරුදු 45 යි.

# ගුරු වර්ග වෙසෙසීම

දනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සඳහා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ III වන කොටසේ විධි විධානවල දක්වා ඇති ඒ ඒ ගුරු වර්ගවලට ඇතුළත් වන වර්තමාන ගුරු චරිත වර්ග පහත දක්වේ.

| | ගුරු වර්ගය | 37/92 චක්‍රලේඛයට අනුව වර්තමාන වැටුප් ක්‍රමය |
|---|---|---|
| (1) | **නුපුහුණු ගුරුවරු** | |
| I | අ. පො. ස(උ.පෙ) විෂය 3 කින් සමත් සහතික ලත් ගුරුවරු | එස්-2-1 |
| II | සහතික නොලත් අ. පො. ස. (සා. පෙ.) ගුරුවරු | එස්-2-1 |
| III | පිළිගත් ආයතනයන්හි තුන් අවුරුදු කලා/සංගීත/නැටුම් සහතික ධාරීන් | එස්-2-1 |
| IV | විශ්ව විද්‍යාල අන්තර් මාධ්‍ය සහතික ධාරීන්/කලා, විද්‍යා විෂයන්ගෙන් විශ්ව විද්‍යා සුදුසුකම් ලැබීමේ විභාග සහතිකධාරීන්<br>කලා විද්‍යා විෂයන්ගෙන් ලන්ඩන් විශ්ව විද්‍යාල ප්‍රවේශ සහතිකධාරීන් | එස්-2-1 |
| V | ගෘහ විද්‍යා ජාතික ඩිප්ලෝමා (දෙහිවල බහු තාක්ෂණික ආයතනය, මහරගම ගුරු විද්‍යාල හා කාර්මික විද්‍යාල) සහතික ලත් ගුරුවරු | එස්-2-1 |
| VII | ප්‍රාචීන පණ්ඩිත, දෙමළ භාෂා පණ්ඩිත සහ පුලවාර් සහතික ධාරීන් | එස්-2-1 |
| VII | අ. පො. ස. (ස.පෙ)/ ජා.පො. අ. ස. සමග අල් - අලීම් ප්‍රාථමික/අවසාන සහතික පත්‍ර, මද්‍රාසා සහතික පත්‍රධාරීන් | එස්-2-1 |
| VIII | සංගීතය පිළිබඳ රාජකීය විද්‍යාලයේ සහතිකය, සංගීතය පිළිබඳව ට්‍රිනිටි විද්‍යාලයේ සහතිකය, සංගීතය පිළිබඳව රාජකීය විද්‍යාලයේ අවසාන සහතිකය VII පන්තිය, සංගීතය පිළිබඳ ට්‍රිනිටි විද්‍යාලයේ උසස් ශ්‍රේණි සහතිකය හෝ විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද අපරදිග සංගීතය පිළිබඳ ශ්‍රේණි සහතිකය දරණ ගුරුවරු | එස්-2-1 |
| IX | ඉංග්‍රීසි /දෙළ / සිංහල ගුරු සහතිකධාරීන් | එස්-2-2 |
| X | ගාන්ධර්ව අවසාන හා පෙරදිග සංගීත/නැටුම් සහතිකධාරීන් | එස්-2-2 |
| XI | ස්වභාෂා/ඉංග්‍රීසි ගුරු සහතිකධාරීන් | එස්-2-2 |
| XII | ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් | එස්-2-2 |

**(2) ගුරු පුහුණුව නොලත් ඩිප්ලෝමාධාරීහු**

| | | |
|---|---|---|
| I | කණිෂ්ඨ විශ්ව විද්‍යාල විද්‍යා/ගණිත ඩිප්ලෝමාධාරීන් | එස්-2-3 |
| II | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ විද්‍යා/ගණිත ඩිප්ලෝමාධාරීන් | එස්-2-3 |
| III | විද්‍යා/ගණිත ඩිප්ලෝමා ගුරුවරු | එස්-2-3 |
| IV | L. T. C. H, F. T. C. H, L. R. M. M., A. T. C. H., L. R. A.M.., M. R. A. M, A. R. C. M. අපරදිග සංගීත ඩිප්ලෝමා සහතිකධාරීන් | එස්-11-1 |

**(3) පුහුණු ගුරුවරු**

| | | |
|---|---|---|
| I | දෑවුරුදු/තුන් අවුරුදු ආයතනික සේවාස්ථ ගුරු පුහුණුව ලත් ගුරුවරු | එස්-11-1 |
| II | තුන් අවුරුදු දුරස්ථ සේවාස්ථ පුහුණුවලත් ගුරුවරු | එස්-11-1 |
| III | තුන් අවුරුදු පූර්ව සේවා ආයතනික ගුරු පුහුණුව ලත් ගුරු ඩිප්ලෝමාධාරීන් | එස්-11-1 |

**(4) වෘත්තිය සුදුසුකම් නොලත්**

| | | |
|---|---|---|
| I | සාමාන්‍ය උපාධිධර ගුරුවරු | එස්-11-3 |
| II | ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ හෝ එම ආයතනය අනුබද්ධ සෞන්දර්ය විද්‍යාලයේ පස් අවුරුදු චිත්‍ර කර්ම ඩිප්ලෝමාධාරීහු | එස්-11-3 |
| III | පිළිගත් කාර්මික විද්‍යාලයක/බහු තාක්ෂණික ආයතනයක සිව් අවුරුදු වාණිජ ඩිප්ලෝමාධාරීහු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරීහු. | එස්-11-3 |
| V | කලින් පැවති සංගීත, නැටුම්, නාට්‍යකරණ හා ලලිත කලා පිළිබඳ විද්‍යාලයේ 4-6 අවුරුදු ඩිප්ලෝමාධාරී සංගීත/නැටුම්/චිත්‍රකර්ම ගුරුවරු | එස්-11-3 |
| VI | සංගීත/නැටුම් පිළිබඳ රාමනාදන් විද්‍යාලයේ සිව් අවුරුදු ඩිප්ලෝමාධාරී ගුරුවරු | එස්-11-3 |
| VII | රජයේ සංගීත/නැටුම් විද්‍යාලයේ 4/5/6 අවුරුදු අවසාන සහතිකධාරීහු | එස්-11-3 |
| VIII | ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ තුන් අවුරුදු චිත්‍ර ඇඳීමේ සහතිකය දරණ ගුරුවරු | එස්-11-3 |
| IX | ශ්‍රී ලංකා කලායතනයෙන් නිකුත් කරන ලද චිත්‍ර ඇඳීමේ/පිත්තාරු කිරීමේ දෑවුරුදු උසස් සහතිකධාරීහු | එස්-11-3 |

| | | |
|---|---|---|
| X | විද්‍යා/ගණිත/ඉංග්‍රීසි/අධ්‍යාපන විද්‍යා/කෘෂිකර්ම උපාධිධාරීහු | එස්-11-4 |
| XI | නුපුහුණු ගෞරව උපාධිධාරීහු | එස්-11-4 |

(5) **වෘත්තිය සුදුසුකම් ලත් උපාධිධාරීහු**

| | | |
|---|---|---|
| I | දැවුරුදු ගුරු පුහුණුව සහිත උපාධිධාරීහු | එස්-11-3 |
| II | අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී සාමාන්‍ය උපාධිධර ගුරුවරු | එස්-11-4 |
| III | අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී ගෞරව/ විශේෂ උපාධිධර ගුරුවරු | එස්-11-5 |